# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2022
2024 ඔක්තෝබර්/ නොවැම්බර්

## මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ දර්ශනය

**බෞද්ධ චින්තාවේ සංවර්ධනය BUPH – 18224**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ධර්ම විනය මුල්කොටගෙන බුද්ධකාලීන සංඝ සමාජයේ උපන් මතවාද මූලාශ්‍රය ඇසුරින් පරීක්ෂා කරන්න.

02. මහාසාංඝික නිකායේ ප්‍රභවය පිළිබඳ පවත්නා වියත් මත ගෙනහැර දක්වා, එම නිකායේ ඉගැන්වීම් ශාසනික ඉතිහාසය කෙරෙහි ඇති කළ බලපෑම කෙබඳු දැයි විමසන්න.

03. ථෙරවාද නිකාය පිළිබඳ ලුහුඬු විවරණයක් ඉදිරිපත් කොට පාලි මූලාශ්‍රය සාහිත්‍යය සංග්‍රහ කිරීමට මෙන්ම සුරක්ෂිතව පවත්වාගෙන යාම පිණිස එම නිකායෙන් ලද දායකත්වය අගයන්න.

04. සර්වාස්තිවාදී නිකායේ ඓතිහාසික පසුබිම ගෙනහැර දක්වා එම නිකායේ මූලික ඉගැන්වීම් පිළිබඳ කෙටි සමාලෝචනයක් කරන්න.

05. මුල් බුදුසමය සමග විසංවාදී නොවන ලෙස පුද්ගල සංකල්පය ඉදිරිපත් කිරීම සඳහා වාත්සීපුත්‍ර හිමියන් ප්‍රමුඛ පුද්ගලවාදීන් විසින් ගෙනහැර දක්වන ලද සාධක ඉදිරිපත් කරන්න.

06. මධ්‍යමික නිකායේ මූලික සිද්ධාන්ත ප්‍රතීත්‍යසමුත්පාදය මත පදනම් වී ඇති ආකාරය සනිදර්ශනව පැහැදිලි කරන්න.

07. විඥානයේ අට වැදෑරුම් පරිණාමය පිළිබඳ යෝගාචාර විඥානවාදී ගුරුකුලයේ අදහස විස්තර කරන්න.

08. බෝධිසත්ත්වවරයෙකු විසින් වර්ධනය කළ යුතු ගුණධර්ම කවරේදැයි මහායාන පාරමිතා ධර්ම ඇසුරින් ඉදිරිපත් කරන්න.

09. තාන්ත්‍රික බුදුසමයේ උදාව කෙරෙහි හින්දු තන්ත්‍ර කෙතෙක් දුරට බලපෑවේදැයි පරීක්ෂා කරන්න.

10. පහත දැක්වෙන මාතෘකා අතුරින් දෙකකට ප්‍රමාණවත් විවරණ සපයන්න.

    i. මොග්ගලීපුත්තතිස්ස හිමි
    ii. ආර්ය අසංග පාදයෝ
    iii. දශභූමි
    iv. බෝධිචර්යාවතාරය

********************************